# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

### අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

1 පත්‍රයට අදාළ ගැටළු

**10 ශ්‍රේණිය**

**6 වන පාඩම - වදන් සැකසුම**

අ.පො.ස.(සා.පෙළ) 2016

1. වදන් සැකසුම් මෘදුකාංගයකින් නිර්මාණය කරන ලද වගුවකට අදාළ පහත වගන්ති සලකන්න:

    A - වගුවක අඩංගු පාඨ හැඩසවි ගැන්විය හැකි ය.

    B - වගුවක තීරුවක් තුළ අඩංගු වචන අකාරාදී පිළිවෙළට සකස් කළ හැකි ය.


    C - වගුවක තීරුවක් තුළ අඩංගු සංඛ්‍යා එකට එකතු කළ හැකි ය.

    ඉහත කුමක් නිවැරදි වේ ද?

    (1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම

අ.පො.ස.(සා.පෙළ) 2017

2. පහත P, Q, R හා S ලෙස ලේබල් කර ඇති නිරූපක හතර, ලේඛනයක ඇති පාඨ (text) එකෙල්ල (align)කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගවල සාමාන්‍ය වශයෙන් භාවිත කරනු ලැබේ.



P Q R S

    පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න:

    A –P මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, R මගින් පාඨ දකුණට එකෙල්ල කරනු ලබයි.

    B –P මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, S මගින් පාඨ දකුණට පමණක් එකෙල්ල කරනු ලබයි.

    C –Q මගින් පාඨ මැදට එකෙල්ල කරන අතර, S මගින් පාඨ වමට හා දකුණට යන දෙපසටම එකෙල්ල (justify) කරනු ලබයි.

    ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ

    (1) A හා B පමණි. (2)A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

3. වදන් සැකසුම් මෘදුකාංගවල සාමාන්‍යයෙන් භාවිත වන කෙටි මං යතුරු සම්බන්ධව පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න:

    A - Ctrl + C යන්න පාඨ/වස්තු කොපි කිරීම (copy) සඳහා භාවිත කරයි.

    B - Ctrl + A යන්න ලේඛනයක ඇති සියලු පාඨ/වස්තු තේරීම (select) සඳහා භාවිත කරයි.

    C - Ctrl + V යන්න කොපි කරන ලද පාඨ/වස්තු ඇලවීම (paste) සඳහා භාවිත කරයි.

    ඉහත කුමන වගන්ති නිවැරදි වේ ද?

    (1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම

අ.පො.ස.(සා.පෙළ) 2018

4. වදන් සැකසූ ලේඛනයක ඇති හිස් වගුවකට පහත කුමන දෑ කළ හැකි ද?
   A - වගුවේ කෝෂ වර්ණ ගැන්වීම
   B - වගුවේ යාබද කෝෂ ඒකාබද්ධ (සංයුක්ත) කිරීම
   C - වගුවට කෝෂ ඇතුළත් කිරීම

   (1) A හා B පමණි (2)A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ලම

5. වදන් සැකසූ ලේඛනයක වූ දෙන ලද වදනක් සෙවීම සඳහා භාවිත කළ හැකි වන්නේ පහත පෙන්වා ඇති කුමන මෙවලම ද?




6. වදන් සකසන මෘදුකාංගයක ඇති තැපැල් මුසුව (mail merge) පහසුකම භාවිත කර ආරාධිතයින් ලැයිස්තුවකට ආරාධනාපත් මුද්‍රණය කිරීම සඳහා වන පහත පියවර සලකා බලන්න.

   A - ආරාධනා ලිපිය ...........P...........ලෙස තැනීම
   B - ආරාධිතයින්ගේ ලැයිස්තුව ලිපිනයන් සමග තනාගෙන .................Q.............ලෙස සුරැකීම
   C - තැපැල් පහසුකම භාවිත කර ..............Q................... ට අනුව අදාළ තොරතුරු ............P............... ට ඇතුළත් කරමින් ආරාධනා පත් මුද්‍රණය කර ගැනීම

   ඉහත වගන්තිවල ඇති හිස්තැන් පිරවීම සඳහා P හා Q ලේබලවලට ගැළපෙන පද යුගලය පිළිවෙළින් සඳහන් වන්නේ කවරක ද?

   (1) දත්ත මූලය (data source), ප්‍රධාන ලේඛනය (master document)
   (2) ප්‍රධාන ලේඛනය, දත්ත මූලය
   (3) ප්‍රධාන ලේඛනය, ශබ්ද නිධිය (thesaurus)
   (4) ශබ්ද නිධිය, ප්‍රධාන ලේඛනය

අ.පො.ස.(සා.පෙළ) 2019

7. වදන් සකසන මෘදුකාංගයක් භාවිත කරමින් ලේඛනයක් සංස්කරණය කරමින් සිටින අතරතුර දී, එම ලේඛනයේ තෝරාගත් කොටසක් වෙනත් ලේඛනයකට පිටපත් කිරීමට ඔබ අදහස් කරයි. මෙම කාර්යය සඳහා පහත සඳහන් කුමන යතුරු සංයෝජනය ඔබ භාවිත කළ යුතු වන්නේ ද?

   (1) Ctrl + C අනතුරුව Ctrl + V (2) Ctrl + N අනතුරුව Ctrl + V
   (3) Ctrl + Pඅනතුරුව Ctrl + V (4) Ctrl + Vඅනතුරුව Ctrl + C

අ.පො.ස.(සා.පෙළ) 2020

8. මයික්‍රොසොෆ්ට් වර්ඩ් සහ ලිබ්රේ ඔෆිස් රයිටර් භාවිත කර සැකසූ නිසි පරිදි හැඩසව්ගන්වන ලද (formatted) ලේඛන එකතුවක් සමන් සතුව පවතී. සෝදුපත් කියවීම සඳහා ඔහුට මෙම ලේඛන කිසිදු හැඩසව්ගැන්වීමක් නොමැතිව සුරැකීමට අවශ්‍යාව ඇත. මෙම කාර්ය සඳහා වඩාත් යෝග්‍යතම ගොනු දිගු ප්‍රරූපය (file extension type) කුමක් ද?

   (1) .odt (2) .txt (3) .docx (4) .pdf

අ.පො.ස.(සා.පෙළ) 2021

9. වදන් සෙවීම සහ ප්‍රතිස්ථාපනය (Find and Replace) සඳහා සඳහා මයික්රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) සහ ලිබ්රේ ඔෆිස් රයිටර් (Libre Office Writer) හී භාවිතා කරනු ලබන කෙටිමං යතුරු (Shortcut key) සංයෝජනය කුමක් ද?



   (1) Ctrl + A (2) Ctrl + C (3) Ctrl + H (4) Ctrl + X

අ.පො.ස.(සා.පෙළ) 2022

10. වදන් සැකසුම් යෙදුමක, ඔබගේ අවසන් ක්‍රියාව/ක්‍රියාවන් ලොප් (undo) කිරීමට ගන්නා කෙටි මං යතුරු සංයෝජනය කුමක් ද?

(1) Ctrl+H (2) Ctrl+N (3) Ctrl +Y (4) Ctrl +Z

11. තෝරාගත් පාඨයක් වෙනස් ලැයිස්තු වර්ග දෙකකට හැරවීමට පහත කවර අයිකන යුගලය භාවිත කළ හැකි ද?

(1) 
(2) 
(3) 
(4) 

12, වදන් සැකසුම් මෘදුකාංගයක් සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි ද?

A - ලේඛනයක ඇති වගුවක (table) ඕනෑම කෝෂ (cells) දෙකක් සංයුක්ත (merge) කළ හැකි ය.
B - ලේඛනයක වචනයක් තෝරා ගැනීමට (select), මූසිකය එකවිට දෙවරක් එම වචනය මත ක්ලික් කළ හැකි ය.
C - සුරකින ලද ගොනුවක් වෙනත් නමක් යොදා සුරැකීමට "File → Save as" තෝරාගැනීම භාවිත කළ හැකිය.

(1) A සහ B පමණි. (2) A සහ C පමණි . (3) B සහ C පමණි. (4) A, B සහ C සියල්ලම

13. වදන් සැකසුම් මෘදුකාංගයක සම්පූර්ණ ලේඛනයම තෝරා ගත හැක්කේ පහත කවර කොට්මං යතුරු සංයෝජනයෙන් ද?

(1) Ctrl+A (2) Ctrl +C (3) Ctrl+N (4) Ctrl+X

**පිළිතුරු**

| | | | | |
|---|---|---|---|---|
| (1) 4 | (2) 2 | (3) 4 | (4) 4 | (5) 1 |
| (6) 2 | (7) 1 | (8) 2 | (9) 3 | (10) 4 |
| (11) 2 | (12) 3 | (13) 1 | | |